# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

# 2020



**ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව**

*சமுதாயஞ்சார் சீர்திருத்தத் திணைக்களம்*

**Department of Community Based Corrections**

**කොමසාරිස්තුමියගේ පණිවිඩය**



බන්ධනාගාර තදබදය අවම කිරීම මූලික අරමුණ කර ගනිමින් හා සුළු වැරදිකරුවන් බන්ධනාගාරගත කිරීම වෙනුවට සමාජය තුළම තබමින් විශෝධන ක්‍රමවේදයන් හරහා නිවැරදි පුද්ගලයින් බවට පත් කිරීම සඳහා 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත යටතේ දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත.

ගත වූ 2020 වර්ෂය තුළදී ආඥාලාභීන් 8,961ක් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය සඳහා අධිකරණය මඟින් යොමු කර ඇත. ලෝකයම මුහුණ දුන් කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ සාමාන්‍ය පරිදි අපහට රාජකාරි සිදුකිරීමට හැකි වූයේ 2020 වර්ෂයේ මාස 06ක පමණ කාලයක් පමණි. විධිමත් අධීක්ෂණ ක්‍රමවේදයක් පවත්වාගෙන යාමට අපහසු වුවද ආඥා කඩ කිරීම් ප්‍රමාණය අවම මට්ටමක පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත්තේ නිලධාරින්ගේ උනන්දුව හා කැපවීම නිසාවෙනි. පැවති අභියෝග හමුවේ වුවද දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන සඳහා වැදගත් වන කටයුතු කිහිපයක් යතාර්ථයක් කර ගැනීමට අපට හැකිවිය.

- මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ වරදකරුවන් විශෝධනය සඳහා විශෝධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා හොරණ ප්‍රදේශයේ ඉඩමක් ලබා ගැනීමට මූලික කටයුතු ආරම්භ කර ඇත.

- ප්‍රජා විශෝධන ක්‍රියාවලිය වඩාත් ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා රට තුළ නීතිය තවදුරටත් ශක්තිමත් කිරීමට හා නීතියේ පවතින බාධාවන් ඉවත් කිරීම සඳහා ප්‍රජා පාදක විශෝධන පනත සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

- බන්ධනාගාර තදබදය අවම කිරීමට හා විශේෂයෙන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ වරදකරුවන් විශෝධනය සඳහා වඩාත් සුදුසු විකල්පය ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය බවට බොහෝ අංශවල අවධානයට ලක් වී ඇත.



.........................

ආර්.පී.එස් සමන්කුමාරි
ප්‍රජා විශෝධන කොමසාරිස්

**2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

**ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව**

**වැය ශීර්ෂ අංකය 326**

**අන්තර්ගතය**


| | | |
|---|---|---|
| **පරිච්ඡේදය 01** | **-** | **ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය** |
| **පරිච්ඡේදය 02** | **-** | **ප්‍රගතිය හා ඉදිරි දැක්ම** |
| **පරිච්ඡේදය 03** | **-** | **වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය** |
| **පරිච්ඡේදය 04** | **-** | **කාර්ය සාධන දර්ශක** |
| **පරිච්ඡේදය 05** | **-** | **තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය** |
| **පරිච්ඡේදය 06** | **-** | **මානව සම්පත් පැතිකඩ** |
| **පරිච්ඡේදය 07** | **-** | **අනුකූලතා වාර්තාව** |

**පටුන** **පිටු අංකය**

1.1 හැඳින්වීම ........................................................................................................................1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු ..............................................................................1

1.3 ප්‍රධාන කාර්යයන් ..............................................................................................................2

1.4 සංවිධාන සටහන.................................................................................................................3

**02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ........................................................4**

2.1 කාර්ය සාධනයට අදාළ තොරතුරු ...........................................................................................4

2.2 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය ( 2020.01.01 දින සිට 2020.12.31 දක්වා)..................6

2.3 ඉලක්ක ...............................................................................................................................8

**03 පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය ......................................................10**

3.1 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය........10

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය .........................................................................................11

3.3 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය...............................12

3.4 මූල්‍ය සටහන් ප්‍රකාශය ........................................................................................................13

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය.................................................................................14

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය...........................14

3.7 මු .රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන...........................................15

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ............................................15

3.9 විගණකාධිපතිගේ වාර්තාව ...............................................................................................16

**04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය ......................................................22**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) ....................22

**05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය......................................................................................................23**

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු ඉලක්කය - .........................................23

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ ....................................................24**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය .........................................................................................24

කාර්ය මණ්ඩල තොරතුරු.......................................................................................................24

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපාන ආකාරය .............25

6.3 මානව සම්පත් සංවර්ධනය.................................................................................................26

**07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව .........................................................28**

# 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

1999 වසරේදී අධිකරණ අමාත්‍යාංශය යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාව තුළ ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. 1999 අංක 46 දරන ප්‍රජා විශෝධන පනත යටතේ අධිකරණ 3කින් ආරම්භ වූ නියමු ව්‍යාපෘතිය මේ වන විට දිවයින පුරා සංචාරක අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ 125ක ක්‍රියාත්මක වේ. සුළු වරදකරුවන් ප්‍රජා විශෝධන ක්‍රියාවලියට යොමු කිරීම තුළින් අධික බන්ධනාගාර තදබදය අඩු කිරීම හා එමගින් වරදකරුවන් නඩත්තුව සඳහා වැයවන අධික වියදම අවම කිරීම, සුළු වරදකරුවන් බන්ධනාගාර ගත කිරීම තුළින් සංවිධානාත්මක අපරාධකරුවන් බවට පත්වීමේ ඉඩකඩ වැළැක්වීම හා ඔවුන් වඩාත් ඵලදායී පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කිරීම සිදු වේ.

අධිකරණයේ සුළු වරදකරුවකු වූ පුද්ගලයෙකුට ප්‍රජා විශෝධන ආඥාවක් ලබාදීම තුළින් අපේක්ෂා කරනුයේ ප්‍රජාව තුළම තබා ඔහුගේ වරදකාරී චර්යා රටාවෙන් මුදවා, යහපත් පුරවැසියකු බවට පත් කිරිමට අවශ්‍ය කටයුතු කිරිමයි.

මේ සඳහා මහේස්ත්‍රාත් අධිකරණවල පිහිටුවා ඇති ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත දෙපාර්තමේන්තු නිලධාරින් විසින් විවිධ විශෝධන වැඩසටහන් සිදුකරනු ලබයි. නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ කටයුතු කරන ආඥාලාභියා නිවැරදි මගට යොමු කිරිම දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවයි.

විශෝධන ක්‍රියාවලිය අවසන් කරන ලද පුද්ගලයින් පිළිබඳව පසුවිපරම් කිරීම කාලීන අවශ්‍යතාවක් වි ඇති බැවින්, ඒ පිළිබඳව ද අවධානය යොමු කරමින් මෙම දෙපාර්තමේන්තුව විසින් ආරම්භයට වඩා මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය පරාසය පුළුල් කර ඇත. එම කාර්යයන් සිදුකිරීම සඳහා දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා මෙම දෙපාර්තමේන්තුව මගින් සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කොට ඇත.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

**වරදින් මිදුණු යහපත් පුරවැසියෙක්**

**මෙහෙවර**

**පසුවිපරමක් සහිත ඵලදායී ප්‍රජා විශෝධන ක්‍රියාවලියක් තුළින් සුළු වරදකරුවන් හා ඔවුන්ගේ පවුල් සමාජීය, ආර්ථික, අධ්‍යාත්මික හා මානසික වශයෙන් සංවර්ධනය කිරීම.**


**අරමුණු**

1. 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත ක්‍රියාත්මක වීම මගින් සුළු වරදකරුවන් බන්ධනාගාර ගත කිරීම නිසා ඇති වන අධික බන්ධනාගාර තදබදය අවම කිරීම
2. සුළු වැරදි සඳහා වරදකරුවන් වන පුද්ගලයින් වැරදි නොකරන යහපත් පුද්ගලයින් බවට පත් කිරීම
3. මෙම පුද්ගලයින්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා සහාය වීම
4. මෙම පුද්ගලයින්ගේ පවුලේ සෙසු සාමාජිකයින්ගේ සාමාජීය, සංස්කෘතික, ආර්ථික තත්ත්වය හා සෞඛ්‍ය තත්ත්වය උසස් කිරීම සඳහා කටයුතු කිරීම
5. මද්‍යසාර හා මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින් ඉන් මුදවා ගැනීම හා මද්‍යසාර හා මත්ද්‍රව්‍ය පාලනය සඳහා දායකත්වය ලබාදීම
6. ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා දායකත්වය ලබාදිය හැකි සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් ඇති කිරීමට දායක වීම

## 1.3 ප්‍රධාන කාර්යයන්

1. මහේස්ත්‍රාත් අධිකරණ මඟින් සුළු වැරදිකරුවන් වූ පුද්ගලයින් ප්‍රජා පාදක විශෝධන නියෝග සඳහා ඇතුළත් කිරීම
2. ආඥාලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම
3. ආඥාලාභීන්ගේ මානසික සෞඛ්‍ය වර්ධනය හා උපදේශන වැඩසටහන් සංවිධානය කිරීම
4. ආඥාලාභීන්ගේ විශේෂ හැකියාවන් හා ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
5. ආඥාලාභීන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
6. ආඥාලාභින් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන්, එම ඇබ්බැහිතාවයෙන් මුදවා ගැනීම සඳහා වෛද්‍ය ප්‍රතිකාරවලට යොමු කිරීම
7. පෞරුෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

1.4 සංවිධාන සටහන



කොමසාරිස් -1
නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (මෙහෙයුම්) - 1
නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (මෙහෙයුම්) - 1
නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (පාලන) - 1
ගණකාධිකාරී - 1
අභ්‍යන්තර විගනක - 1
ජ්‍යෙෂ්ඨ ප්‍ර.වි.නි - 10
පරිපාලන නිලධාරී - 1
භාෂා පරිවර්තක - 1
ප්‍රාදේශීය කාර්යාල
ප්‍ර.වි.නි
සංවර්ධන නිලධාරී (ප්‍රජා විශෝධන)
වැඩ පරීක්ෂක
සංවර්ධන අංශය
සංවර්ධන නිලධාරී වැඩ සටහන් සහකාර
කළමනාකරණ සේවා නිලධාරී
කා.කා.ස
පාලන අංශය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
කළමනාකරණ සේවා නිලධාරී
ලිපිකරු
රියදුරු
කා.කා.ස
ගිණුම් අංශය
කළමනාකරණ සේවා නිලධාරී
ලිපිකරු
කා.කා.ස

## 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 කාර්ය සාධනයට අදාළ තොරතුරු

අ) මහේස්ත්‍රාත් අධිකරණ මගින් ලබා දුන් ආඥාලාභීන් සංඛ්‍යාව - පළාත් අනුව (2020.01.01 – 2020.12.31)

| පළාත | නියෝග ලැබූ ආඥාලාභීන් සංඛ්‍යාව |
|---|---:|
| බස්නාහිර | 4,083 |
| මධ්‍යම | 797 |
| ඌව | 546 |
| දකුණ | 1,255 |
| සබරගමුව | 789 |
| නැගෙනහිර | 498 |
| වයඹ | 269 |
| උතුරු මැද | 223 |
| උතුර | 501 |
| එකතුව | 8,961 |

ආ) මහේස්ත්‍රාත් අධිකරණ මගින් ලබා දුන් ආඥාලාභීන් සංඛ්‍යාව - වරද අනුව (2020.01.01 – 2020.12.31)

| වරද | නියෝග ලැබූ සංඛ්‍යාව |
|---|---:|
| හෙරොයින් | 3,127 |
| ගංජා | 1,278 |
| නීති විරෝධී මත්පැන් | 2,540 |
| මහජන පීඩා | 326 |
| සොරකම් | 32 |
| වංචාව | 0 |
| අනවසර ආයුධ | 5 |
| සොරබඩු ලග තබා ගැනීම | 0 |
| සූදුව | 256 |
| කෝලාහල | 39 |
| වෙනත් | 1,358 |
| එකතුව | 8,961 |

ඇ) විශෝධන ආඥා පිළිබඳව තොරතුරු - (2020.01.01 සිට 2020.12.31 දක්වා)

| ලබා දී ඇති ආඥා සංඛ්‍යාව | ආඥාව අවසන් කරන ලද | | ආඥා කඩ කිරීම් (2019 වර්ෂයේ ලැබී ඇති ආඥාලාභීන්ගේ විස්තරද මීට ඇතුළත් වේ) | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 8,961 | 3,574** | 39.8% | 1,528 | 17.0% |

** අනෙකුත් නියෝග තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී

- පවත්වන ලද විශෝධන වැඩසටහන් පිළිබඳව තොරතුරු (2020.01.01 සිට 2020.12.31 දක්වා)

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|
| උපදේශන | 610 | 3,485 |
| අධ්‍යාත්මික සංවර්ධන | 83 | 971 |
| ශ්‍රමදාන | 174 | 1,577 |
| මත් නිවාරණ | 32 | 270 |
| වෘත්තිය පුහුණු | 7 | 108 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | 24 | 391 |
| විශේෂ දින වැඩසටහන් | 04 | 32 |
| එකතුව | 946 | 6,834 |

- 2020 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුවට වෙන් වූ මුදල් යොදවා ආඥාලාභීන් විශෝධනය සඳහා සිදු කරන ලද වැඩසටහන් පිළිබඳව තොරතුරු

| වැඩසටහන් සංඛ්‍යාව | වියදම (රු.) |
|---|---|
| 50 | 776,169.00 |

- **සාර්ථකව විශෝධනය කරන ලද පුද්ගලයින් සමාජ ආර්ථික වශයෙන් නඟා සිටුවීම**

පවුල් සංවර්ධන වැඩසටහන් යටතේ ස්වයං රැකියා ආධාර (විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක නොවන පළාත්වල ) රු. 25 000.00ක උපරිමයකට යටත්ව ආඥාලාභීන් 09 දෙනෙකු සඳහා රු. 220 000.00 ප්‍රමාණයක් ලබා දෙන ලදි.

| පවුල් සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | වියදම (රු.) |
|---|---|
| 09 | 220,000.00 |

## 2.2 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2020.01.01 දින සිට 2020.12.31දක්වා)

**මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන් විශෝධනය කිරීමේ ව්‍යාපෘතිය**

මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින් විශෝධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර, මේ යටතේ වයඹ, දකුණ, සබරගමුව හා බස්නාහිර පළාත්වල මෙම විශේෂ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අනුව 2020 වර්ෂයේ මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ලබාදෙන ලද පුද්ගලයින් අතුරින් පුද්ගලයින් සංඛ්‍යාව 2,165ක් (ගංජා, හෙරෝයින් හා නීති විරෝධී මත් පැන්) මෙම ව්‍යාපෘතිය යටතේ විශෝධන කටයුතු සඳහා යොමු කර ඇත. මෙම පුද්ගලයින් විශේෂ මත් නිවාරණ උපදේශන ක්‍රියාවලියෙන් පසුව මත් ප්‍රතිකාර සඳහා යොමු කරනු ලබන අතර එහිදී වෛද්‍ය උපදෙස් පරිදි නේවාසික හෝ සායනික ප්‍රතිකාර සඳහා යොමු කරනු ලබයි. ප්‍රතිකාර හා විශේෂ මත් නිවාරණ උපදේශන ක්‍රියාවලිය මඟින් මතින් මිදී නිවෙසට පැමිණෙන පුද්ගලයින් තම පවුල තුළ පිළිගැනීම හා පවුල් සංවර්ධනය සඳහා පවුලේ සෙසු සාමාජිකයින්ගේ සහයෝගය ලබාගත යුතු ආකාරය පිළිබඳව දැනුවත් කිරීම හා සූදානම් කිරීම සංවර්ධන නිලධාරි (ප්‍රජා විශෝධන) විසින් සිදු කරනු ලබයි. ප්‍රජා විශෝධන ක්‍රියාවලියෙන් පසුව සාර්ථකව විශෝධනය වූ, ස්ථිර ආදායමක් නොමැති පුද්ගලයින් සඳහා ස්ථිර ආදායමක් ලබා ගත හැකි රැකියාවකට යොමු කිරීම හෝ රැකියාවක් කිරීමට අවශ්‍ය නිපුණතාවය ලබා ගැනීම සඳහා මෙම පුද්ගලයින් යොමු කරනු ලබයි. එමෙන්ම ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා හැකියාව හා කැමැත්ත තිබෙන පුද්ගලයින් ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා යොමු කරනු ලබයි. ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා ආරම්භක ප්‍රාග්ධනය සලසාගත නොහැකි ආඥාලාභීන් සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ රු.50,000.00 උපරිමයකට යටත්ව මූල්‍ය ආධාරයක්ද (උපකරණ හෝ අමු ද්‍රව්‍ය) ලබාදීමට කටයුතු කර ඇත. ඒ අනුව 2020 වර්ෂයේ එවැනි ආඥාලාභීන් 23දෙනෙකු සඳහා ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා රු. 855,950.00ක මුදලක් මෙම දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇත.

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) | වැය කරන ලද කාරණය | වැය වූ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | පළාත | මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් සංඛ්‍යාව | සාර්ථකව විශෝධනය කරන ලද සංඛ්‍යාව | ප්‍රගතිය (%) | ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා ආධාර - ලබාදුන් සංඛ්‍යාව | ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා ආධාර - ලබාදුන් මුදල(රු.) |
| මත් ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන් විශෝධනය කිරීමේ ව්‍යාපෘතිය (බස්නාහිර පළාත,වයඹ පළාත, සබරගමුව පළාත හා දකුණු යන පළාත්වල) | 2.62 | නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සහ පවුල් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම | 1.23 | 47% | වයඹ | 234 | 60 | 57.1 | 08 | 231,900.00 |
| | | | | | දකුණ | 581 | 107 | 48.0 | 01 | 44 000.00 |
| | | | | | සබරගමුව | 469 | 82 | 56.2 | 02 | 95,000.00 |
| | | | | | බස්නාහිර | 881 | 59 | 38.8 | 12 | 485,050.00 |
| | | | | | එකතුව | 2,165 | 308 | 49.2 | 23 | 855,950.00 |

## 2.3 ඉලක්ක

01. සුළු වැරදි සම්බන්ධ වරදකරුවන් වන පුද්ගලයින් ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කර ගැනීම, වැඩි කර ගැනීම හා විශෝධන කටයුතුවල සාර්ථකත්වය වැඩි කිරීම

02. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය

- ❖ කෙටිකාලීන මත් නිවාරණ පුහුණුව ලබාදීම
- ❖ ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරි හා ප්‍රජා විශෝධන නිලධාරීන් සඳහා ප්‍රජා පාදක විශෝධනය පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය ලබාදීම
- ❖ සංවර්ධන නිලධාරීන් සඳහා උපදේශනය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව ලබාදීම තවදුරටත් සිදු කිරීම
- ❖ සියලුම නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම
- ❖ ප්‍රජා විශෝධනය හා ඊට අදාළ වන අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව විදේශීය පුහුණුව ලබාදීම

03.ප්‍රතිකාර ක්‍රියාවලිය විධිමත් කිරීම

- ❖ ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි ප්‍රතිකාර මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම (සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ )
- ❖ මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව විද්‍යාගාර පරීක්ෂණ මගින් තක්සේරුගත කිරීම
  හා තහවුරු කර ගැනීම

04. මෙම දෙපාර්තමේන්තුවට අයත් විශෝධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම (හොරණ ප්‍රදේශයේ)

05. සාර්ථකව විශෝධනය වන ආඥාලාභීන් සුළු පරිමාණ ව්‍යවසායකයන් බවට පත් කිරීම

06. ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය මහජනතාවට සමීප කිරීම සඳහා ප්‍රචාරණ කටයුතු පුළුල් කිරීම

07. ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලියේ තොරතුරු කළමනාකරණය කිරීම සඳහා කටයුතු කිරීම

- ❖ වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම
- ❖ ආඥාලාභී තොරතුරු කළමනාකරණ පද්ධතියක් සකස් කර පවත්වාගෙන යෑම

08. ප්‍රජා පාදක විශෝධන පනත සඳහා අවශ්‍ය සංශෝධනයන් සිදු කරමින් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කිරීම සහ බන්ධනාගාරගත වී නිදහස් වන පුද්ගලයන් සමාජගත කිරීම සඳහා (අවධානම් මට්ටම හා අවශ්‍යතාව අනුව) වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා අවධානය යොමු කෙරේ

09. ආඥාලාභීන්ගේ බහුතරය මත්පැන් සහ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයන් බැවින් සාක්ෂිපාදක ප්‍රතිකාර ක්‍රමවේදයක් මඟින් පුද්ගලයන් විශෝධනයට ලක් කිරීම. මෙම ව්‍යාපෘතිය 2021 වසර වල දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට නියමිතය.

10. සංවර්ධන නිලධාරීන් හරහා ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ පසු විපරම් ක්‍රියාවලිය විධිමත් කිරීම

11. ආඥාලාභීන් සාර්ථකව විශෝධනය කිරීමෙන් අනතුරුව වරදින් මිදුණු යහපත් පුද්ගලයින් බවට පත් කිරීම හා ඔවුන්ගේ පවුල් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක කිරීම (මේ සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් රාජ්‍ය බැංකු මඟින් සුළු පොලී අනුපාත යටතේ ණය යෝජනා ක්‍රමයක් ඇති කිරීම)

# 03 පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය

## 3.1  2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | රු. | ඒසීඒ-එෆ් |
| අයවැය 2020 | | සටහන | තත්‍ය | | |
| | | | 2020 | 2019 | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 306,840,000 | 284,669,000 | **ඒසීඒ-3** |
| - | තැන්පතු | | 172,289 | 196,529 | **ඒසීඒ-4** |
| - | අත්තිකාරම් ගිණුම් | | 7,613,363 | 11,345,296 | **ඒසීඒ-5** |
| - | වෙනත් ලැබීම් | | 13,766,773 | 11,941,696 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **328,392,425** | **308,152,522** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **328,392,425** | **308,152,522** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | | ඒසීඒ2(ii) |
| 280,382,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 274,961,169 | 245,217,841 | |
| 39,405,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 31,415,997 | 33,120,947 | |
| 2,807,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 2,749,365 | 2,789,267 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 50,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| 322,644,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **309,126,531** | **281,128,056** | |
| | **මූලධන වියදම්** | | | | |
| 4,612,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 2,393,323 | 2,037,619 | ඒසීඒ2(ii) |
| 3,617,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 3,611,189 | 4,651,743 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 3,017,000 | හැකියා වර්ධනය | 14 | 3,000,745 | 4,591,451 | |
| 2,620,000 | වෙනත් මූලධන වියදම් | 15 | 1,231,885 | 2,130,418 | |
| 13,866,000 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **10,237,142** | **13,411,232** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **9,040,836** | **12,136,322** | |
| | **තැන්පතු ගෙවීම්** | | 294,870 | 155,950 | **ඒසීඒ-4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 8,745,966 | 1,980,372 | **ඒසීඒ-5** |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | 328,404,509 | 306,675,609 | |
| 336,510,000 | **2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | (12,084) | 1,476,913 | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2020 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තත්‍ය 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 43,061,069 | 39,376,635 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 33,838,399 | 33,255,796 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 706,903 |
| **මුළු වත්කම්** | | **76,899,468** | **73,339,334** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 33,793,001 | 32,655,817 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 43,061,069 | 39,376,635 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | 550,000 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 45,398 | 49,979 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 706,903 |
| **මුළු වගකීම්** | | **76,899,468** | **73,339,334** |

පිටු අංක 06 සිට 47 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 48 සිට 56 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ................ | ........................................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 18.02.2021 | දිනය : 2021/02/17 | දිනය : 2021. 02. 16 |
| මේජර් ජෙනරාල් (විශ්‍රාමික) වී.ආර්. සිල්වා<br>ලේකම්<br>බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය<br>නො. 40, බුත්ගමුව පාර, රාජගිරිය | ආර්.පී.එස්. සමන්කුමාරි<br>කොමසාරිස්<br>...ාදක විශෝධන දෙපාර්තමේන්තුව | චන්ද්‍රකාන්ති ගුණවර්ධන<br>ගණකාධිකාරී<br>ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව |

## 3.3 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය
**ඒසීඒ-සී**

| | තත්‍ය | |
|---|---|---|
| | 2020 | 2019 |
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 13,766,773 | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 306,840,000 | 296,610,696 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **320,606,773** | **296,610,696** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 304,570,545 | 277,340,622 |
| සහනාධාර සහ මාරුකිරීම් | 2,749,365 | 2,789,267 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 4,669,153 | 4,253,857 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 1 | 223 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **311,989,064** | **284,383,968** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **8,617,709** | **12,226,728** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 6,322,846 | 10,011,717 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **6,322,846** | **10,011,717** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 8,022,120 | 11,411,855 |
| අත්තිකාරම් ගෙවීම් | 6,795,854 | 10,867,169 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **14,817,973** | **22,279,025** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(8,495,127)** | **(12,267,307)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **122,582** | **(40,579)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 172,289 | 196,529 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **172,289** | **196,529** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 294,870 | 155,950 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **294,870** | **155,950** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(122,582)** | **40,579** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **-** | **(0)** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

## 3.4 මූල්‍ය සටහන් ප්‍රකාශය

| වාර්තාකිරීමේ පදනම | |
|---|---|
| 1) | වාර්තාකරණ කාලපරිච්ඡේදය |
| | 2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ. |
| 2) | මිනුම්කරණ පදනම |
| | මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. |
| | මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත. |
| 3) | ආදායම් හඳුනාගැනීම |
| | හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ. |
| 4) | දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම |
| | වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. |
| | දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී. |
| 5) | දේපළ, පිරියත හා උපකරණ සංචිතය |
| | මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ. |
| 6) | මුදල් හා මුදල් සමාන දෑ |
| | 2020 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ. |

### 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| | | | | රු. 000 | |
|---|---|---|---|---|---|
| ආදායම් සංකේතය | ආදායම් විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
| | | මූලික ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස |
| | **අදාළ නැත** | | | | |

### 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 322,644,000 | 322,644,000 | 309,126,531 | 96% |
| ප්‍රාග්ධන | 13,866,000 | 13,866,000 | 10,237,142 | 74% |

**3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|---|
| | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| 1 | මැතිවරණ කොමිෂන් සභාව ( 020-1-1-4-1409) | 669,153.47 | 669,153.47 | 669,153.47 | 100% |
| 2 | මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය( 104-01-02-00-1003) | 2,800,000.00 | 2,800,000.00 | 2,800,000.00 | 100% |
| 3 | රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය( 130-1-14-0-1003 ) | 1, 280,000.00 | 1,280,000.00 | 1,200,000.00 | 94% |

**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

| වත්කම් කේතය | වත්කම් කේත විස්තරය | 2019.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස |
|---|---|---|---|---|---|
| 9152 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 43,061,069.46 | 43,061,069.46 | - | 100% |

## 3.9 විගණකාධිපතිගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : ජේපීඒ/සී/සී,ඊ/සීබීසී/එෆ්ඒ/2020

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2021 මැයි 06 දින

ගණන් දීමේ නිලධාරී

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>තත්ත්වාගණනය මතය</u>

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ

වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

**1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

**1.6.1.1. මූල්‍ය නොවන වත්කම්**

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම ලෙස රු.3,611,189 ක් ඇතුළත් කර තිබුණ ද එය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඒසීඒ - 06 ආකෘතියෙහි රු.3,684,435 ක් ලෙස දක්වා තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. වියදම් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 13 ක් සඳහා සලසා ගෙන තිබූ රු.27,619,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් සියයට 30 කට වැඩියෙන් එනම් රු.8,330,635 ක ප්‍රතිපාදන ඉතිරිව තිබූ අතර එම එක් එක් වැය විෂයයන් හි ඉතිරිවීම් සියයට 16 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි.

(ආ) මූලධන වැය විෂයයන් 04 ක් සඳහා සලසා ගෙන තිබූ රු.7,232,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් සියයට 50 කට වැඩියෙන් එනම් රු.3,606,792 ක ප්‍රතිපාදන ඉතිරිව තිබූ අතර එම එක් එක් වැය විෂයයන් හි ඉතිරිවීම් සියයට 42 සිට සියයට 80 ක් දක්වා වූ පරාසයක පැවතුණි.

**2.2. බැරකම් හා බැදීම්වලට එළඹීම**

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.1 ඡේදයට අදාල මාර්ගෝපදේශ අංක 06 හි 6 ඡේදය ප්‍රකාරව සටහන (iv) බැරකම් ප්‍රකාශයෙහි මුදල් රෙගුලාසි 94(2) හා (3) ප්‍රකාරව එලඹෙන ලද බැදීම් ඇතුළත් විය යුතු වුවද වාර්ෂිකව පුනරාවර්තනය වන සේවාවන් හෝ සැපයුම් නොවන රු.202,164 ක දේශීය ගමන් වියදම් ඇතුළත් කර තිබුණි.

**2.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව කාර්යය නිම කළ විගසම ලබා ගත් අත්තිකාරම් මුදල් පියවිය යුතු වුවත් විවිධ කාර්යයන් සඳහා අවස්ථා 165 කදී ලබා දී තිබූ රු.1,530,620 ක අත්තිකාරම් මුදලකින් ඉතිරිය වූ රු.759,470 ක මුදලක් දින 13 – 227 අතර කාලයක් ප්‍රමාද කර පියවා තිබුණි.

**2.4. බැංකු ගිණුම් මෙහෙයවීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) අංක 100159027420 දරන බැංකු ගිණුමෙහි 2020 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ දින සිට මාස 06 ඉක්මවූ බැංකුවට ඉදිරිපත් නොකරන ලද එකතුව රු.37,035 ක් වූ චෙක්පත් 29 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව හඳුනා නොගත් රු.30,048 ක් වූ චෙක්පත් ලැබීම් 16 ක් මෙම වාර්තාවේ දින වන විටත් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. ප්‍රසම්පාදනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 4(2) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන්

ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු අතර එම වගන්තියේ 4(2)(2) හි දැක්වෙන පරිදි ප්‍රසම්පාදන කටයුතු ආරම්භවීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු, එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන් හි පියවර දැක්වෙන පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතු වුවද 2020 වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ලංසුකරු වෙත විධිමත් ප්‍රතිග්‍රහන ලිපිය නිකුත් කිරීමත් සමඟම රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතුය. නමුත් රු.3,307,159 ක් වටිනා කාර්යාල උපකරණ ගැනීමේ ප්‍රසම්පාදනය සඳහා කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

එම්.ජී.බී.ජී.පී.ප්‍රනාන්දු
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

## 04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමවුම | | |
|---|---|---|---|
| | 100% -90% | 75% - 89% | 50% -74% |
| සමස්ත කාර්ය සාධන දර්ශකය | | 60% | |

## 05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු ඉලක්කය - 03 නිරෝගීකම සහ යහපැවැත්ම

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%- 49% | 50%- 74% | 75%- 100% |
| 1.1999 අංක 46 දරණ ප්‍රජා පාදක විශෝධන පනත ක්‍රියාත්මක වීම මඟින් සුළු වරදකරුවන් බන්ධනාගාර ගත කිරීම වෙනුවට ඔවුන් ප්‍රජාව තුළ විශෝධනය කිරීම.<br>2.සුළු වරදකරුවන් බන්ධනාගාර ගත වීම අඩුකර බන්ධනාගාර තදබදය හා ඒ සඳහා වැයවෙන රජයේ වියදම අඩුකිරීම.<br>3.ප්‍රජා විශෝධන ආඥාලාභීන් මානසික,අධ්‍යාත්මික, සමාජීය හා ආර්ථික වශයෙන් සංවර්ධනය කිරීම හා ඔවුන්ගේ පවුල් ආර්ථික සමාජීය හා අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කිරීම. | • 2020 වර්ෂය තුළ ආඥාලාභීන් 15000ක් විශෝධනය සඳහා යොමු කරවා ගැනීම කිරීම.<br>• ආඥාලාභියකු වෙනුවෙන් වූ රජයේ වියදම රු 695.00 කින් අඩු කිරීම.( බන්ධනාගාර රැඳවියකු වෙනුවෙන් දිනක වියදම රු 695.00)<br>• වසර තුළ ලබා ගන්නා ලද ආඥාලාභීන්ගේ පවුල් ආර්ථික සමාජීය හා අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කිරීම | වසර තුළ ලබා ගන්නා ලද ආඥාලාභීන් සංඛ්‍යාව<br>වසර තුළ ලබා ගන්නා ලද ආඥාලාභීන් සංඛ්‍යාව<br>වසර තුළ පවත්වන ලද විශෝධන වැඩසටහන් සංඛ්‍යාව - 946 | | 60% | |

කොරෝනා වසංගත තත්වය මත අධිකරණ මඟින් ලබාදෙන ලද ප්‍රජා පාදක විශෝධන නියෝග සංඛ්‍යාව වෙනත් වසරවලට සාපේක්ෂව අඩු වූ අතර ඒ අනුව ප්‍රාදේශිය කාර්යාල මඟින් ආඥාලාභීන් වෙනුවෙන් සිදුකරනු ලබන වැඩසටහන් සංඛ්‍යාවද අඩු වීමක් සිදු විය. (නිලධාරින්ගේ හා වරදකරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ගරු අධිකරණය සැලකිලිමත් වූ බැවින්)

# 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 6 | 3 | 3 |
| තෘතීයික | 137 | 110 | 27 |
| ද්විතියික | 479 | 427 | 52 |
| ප්‍රාථමික | 12 | 9 | 3 |

- කාර්ය මණ්ඩල තොරතුරු (2020.01.01 -2020.12.31)

**කාර්ය මණ්ඩල තොරතුරු**

<table>
<tr><th>අ.අ.</th><th colspan="2">තනතුර</th><th>අනුමත සේවක සංඛ්‍යාව</th><th>දැනට සිටින සේවක සංඛ්‍යාව</th><th>පුරප්පාඩු සංඛ්‍යාව</th></tr>
<tr><td>1</td><td colspan="2">ප්‍රජා විශෝධන කොමසාරිස්</td><td>01</td><td>01</td><td>00</td></tr>
<tr><td rowspan="2">2</td><td rowspan="2">සහකාර කොමසාරිස් / නියෝජ්‍ය කොමසාරිස්</td><td>ශ්‍රී ලං.ප.සේ.II හෝ III</td><td>01</td><td>01</td><td>-</td></tr>
<tr><td>දෙපාර්තමේන්තු ගත</td><td>02</td><td>01</td><td>01</td></tr>
<tr><td>3</td><td colspan="2">ගණකාධිකාරී</td><td>01</td><td>-</td><td>01</td></tr>
<tr><td>4</td><td colspan="2">අභ්‍යන්තර විගණක</td><td>01</td><td>-</td><td>01</td></tr>
<tr><td>5</td><td colspan="2">පරිපාලන නිලධාරී</td><td>01</td><td>-</td><td>01</td></tr>
<tr><td>6</td><td colspan="2">ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී</td><td>10</td><td></td><td>10</td></tr>
<tr><td>7</td><td colspan="2">භාෂා පරිවර්තක (දෙමළ)</td><td>01</td><td>-</td><td>01</td></tr>
<tr><td>8</td><td colspan="2">ප්‍රජා විශෝධන නිලධාරී</td><td>125</td><td>110</td><td>15</td></tr>
<tr><td>9</td><td colspan="2">වැඩසටහන් සහකාර</td><td>04</td><td>0</td><td>04</td></tr>
<tr><td>10</td><td colspan="2">සංවර්ධන නිලධාරී<br>අභ්‍යාසලාභී</td><td>328</td><td>283<br>17</td><td>45</td></tr>
<tr><td>11</td><td colspan="2">තොරතුරු සන්නිවේදන සහකාර</td><td>02</td><td>02</td><td>00</td></tr>
<tr><td>12</td><td colspan="2">රාජ්‍ය කළමනාකරණ සහකාර<br>ලිපිකරු</td><td>20</td><td>11<br>05</td><td>04</td></tr>
<tr><td>13</td><td colspan="2">වැඩපරීක්ෂක</td><td>125</td><td>109</td><td>16</td></tr>
<tr><td>14</td><td colspan="2">කාර්යාල කාර්ය සහායක</td><td>08</td><td>05</td><td>03</td></tr>
<tr><td>15</td><td colspan="2">රියදුරු</td><td>04</td><td>04</td><td>-</td></tr>
<tr><td colspan="3">එකතුව</td><td>634</td><td>549</td><td>102</td></tr>
</table>

## 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපාන ආකාරය

මේ වනවිට දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහල නැංවීම උදෙසා අත්‍යවශ්‍යම තනතුරු සඳහා පුරප්පාඩ පවතී. උදාහරණ ලෙස,

- සහකාර කොමසාරිස් (ශ්‍රී ලං.ප.සේ III/II) – 01
- සහකාර කොමසාරිස් - මෙහෙයුම් (දෙපාර්තමේන්තුගත) 01
- ගණකාධිකාරී - 01 (විශ්‍රාමික නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ඇත)
- අභ්‍යන්තර විගනක - 01
- පරිපාලන නිලධාරී - 01
- ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී - 10 (පත් කිරීම සඳහා කටයුතු සිදු වෙමින් පවතින අතර ලකුණු පටිපාටිය අනුමැතියට යවා ඇත.)
- භාෂා පරිවර්තක - 01
- ප්‍රජා විශෝධන නිලධාරී - 15
- සංවර්ධන නිලධාරී - 45
- වැඩසටහන් සහකාර - 04
- වැඩ පරීක්ෂක - 16 , දැක්විය හැකිය.

මේ තත්වය යටතේ දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව ඉටු කිරීමේ බාධා ඇත. විධායක මට්ටමේ තනතුරු පුරප්පාඩු වීම මත ආයතනයේ දැනට සේවයේ නියුතු 549 දෙනෙකුගේ පරිපාලන හා ආයතන කටයුතු නිසියාකාරව පවත්වාගෙන යාමටත් පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමටත් බාධා සිදු වේ. එමෙන්ම ප්‍රජා විශෝධන නිලධාරී හා වැඩ පරීක්ෂක පුරප්පාඩු වීම හේතුවෙන් ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාල නිසි පරිදි ක්‍රියාත්මක නොවීම මත ආයතනයේ ප්‍රධාන කාර්ය භාරය වන ආඥාලාභීන් විශෝධනය කිරීමේ කටයුතු සඳහා බාධා සිදු වේ. තවද අධිකරණය මඟින් ලබා දෙන ප්‍රජා පාදක විශෝධන නියෝග අනුව ආඥාලාභීන් පසුවිපරම් කටයුතු එනම් ආඥාලාභීන්ගේ අපරාධකාරී චර්යාව වෙනස් කිරීම සඳහා අවශ්‍යතා අනුව නිවාස පරික්ෂාවේ යෙදීමට සංවර්ධන නිලධාරි (ප්‍රජා විශෝධන) ප්‍රමාණවත් පරිදි නොමැති වීමද ගැටලුවකි. ප්‍රමාණවත් පරිදි අධීක්ෂණ මට්ටමේ නිලධාරි නොමැතිකම දෙපාර්තමේන්තුවේ දැක්ම සඳහා ලඟා වීමට බාධාවක් වේ.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (RS'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශිය/ විදේශිය) | නිමවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශිය | විදේශිය | | |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක පිළිබඳව අලෙවි හා ප්‍රවර්ධන පුහුණුව - ඉන්දියාව | 02 | මාස 02 | | | විදේශිය | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක පිළිබඳව අලෙවි හා ප්‍රවර්ධන පිළිබඳව දැනුම |
| මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් මුදවා ගැනීම හා පුනරුත්ථාපනය කිරීම පිළිබඳව පුහුණුව - ජපානය | 01 | දින 07 | | | විදේශිය | ඇබ්බැහි වූවන් මුදවා ගැනීම හා පුනරුත්ථාපනය පිළිබඳව දැනුම |
| මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව | 01 | වසර 01ක් | 100,000.00 | | දේශිය | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ දැනුම |
| ප්‍රථමාධාර හා කොවිඩ් තත්ත්වය හමුවේ රාජකාරි කටයුතු කිරීමේදී පිළිපැදිය යුතු සෞඛ්‍ය පුරුදු පිළිබඳව දැනුවත් කිරීම | | දින 01 | 4,800.00 | | දේශිය | ප්‍රථමාධාර හා සෞඛ්‍යාරක්ෂිත ක්‍රම පිළිබඳව දැනුම |
| ප්‍රජා විශෝධන නිලධාරීන් හා වැඩ පරීක්ෂකවරුන් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීම (මධ්‍යම පළාත) | 28 | දින 02 | 16,400.00 | | දේශිය | ප්‍රජා විශෝධන පනතේ ප්‍රායෝගික භාවිතාව හා මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය පිළිබඳව දැනුම |
| ප්‍රජා විශෝධන නිලධාරීන් සඳහා මූලික පරිගණක දැනුම ලබාදීම | 12 | දින 05 | 93,058.75 | | දේශිය | පරිගණක හැසිරවීමේ දැනුම ලබාදීම |
| උපදේශන ඩිපලෝමා පාඨමාලාව | 106 | වසර 02 | 2,400,000.00 | | දේශිය | පුද්ගල හා කණ්ඩායම් උපදේශන කුසලතාව |
| **එකතුව** | | | **2,614,258.75** | | | |

**ආයතනයේ කාර්ය සාධනය සඳහා පුහුණු වැඩ සටහන් දායක වන ආකාරය**

ආයතනයක නිලධාරින් සඳහා නිරන්තර පුහුණුවක් ලබා දීම ආයතනයේ කාර්යක්ෂමතාවයට ඉවහල් වේ. ඒ අනුව මේ වන විට දෙපාර්තමේන්තුව මඟින් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ ආඥාලාභීන් සඳහා විශේෂයෙන් කටයුතු කෙරේ. එම රාජකාරි කටයුතු සාර්ථක කර ගැනීම සඳහා නිලධාරින්ගේ උපදේශන කුසලතා, මත්ද්‍රව්‍ය භාවිතය හා ප්‍රතිකාර පිළිබඳ දැනුම හා ව්‍යාපෘති කළමනාකරණය, ආඥාලාභී ස්වයං රැකියා ව්‍යාපෘති තෝරා ගැනීම වැනි කුසලතා හා දැනුම දියුණු කළ යුතු වේ.

ඒ අනුව එක්සත් ජාතින්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය සම්බන්ධ කරගෙන අවශ්‍ය දැනුම ලබා දීමට කටයුතු කෙරේ. එහි මූලික අදියර ලෙස 2020 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ මධ්‍යම හා උතුරු මැද පළාත කේන්ද්‍ර කරගනිමින් ප්‍රජා විශෝධන නිලධාරී, හා වැඩ පරීක්ෂකවරුන් සඳහා පුහුණුව ලබාදී ඇත. මෙම ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් නිලධාරීන්ගේ නායකත්වය හා ආකල්පමය සංවර්ධනය උදෙසා දායක වන අතර වඩාත් කාර්යක්‍ෂම සේවයක් ලබා දීමට නිලධාරීන් පෙළඹනු ඇත.

මෙම දෙපාර්තමේන්තුවේ පරමාර්ථ, සාර්ථකව ඉටු කර ගැනීම සඳහා ප්‍රමුඛතම සාධකය වනුයේ වරදකරුවන් හා ඔවුන්ගේ පවුල් හා සෘජුවම සම්බන්ධ වන නිලධාරීන් සඳහා පුහුණුව ලබාදීම වේ. එමෙන්ම එම පුද්ගලයින්ගේ ආර්ථික, සාමාජීය හා අධ්‍යාත්මික සංවර්ධනය සඳහා මෙම නිලධාරීන් කටයුතු කරන බැවින් උපදේශනය, මත්ද්‍රව්‍ය භාවිතය හා ප්‍රතිකාර, ව්‍යාපෘති කළමනාකරණය හා වරදකරුවන් සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති තෝරා ගැනීම සම්බන්ධව නිලධාරීන් සඳහා පුහුණුව ලබාදීම අවශ්‍ය වේ. පුද්ගල හා කණ්ඩායම් උපදේශන කුසලතා වර්ධනය කිරීම සඳහා සංවර්ධන නිලධාරි (ප්‍රජා විශෝධන) වෙනුවෙන් උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව ඉවහල් වනු ඇත. ඒ අනුව ඉහත සඳහන් පුහුණුවීම් මෙම දෙපාර්තමේන්තුව මඟින් නිලධාරීන් වෙනුවෙන් සිදු කරමින් පවතී.

## 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය අනුකූල වේ/ අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම | අනුකූල වේ | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.6 | වෙනත් | | | |
| 2 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445) | අනුකූල වේ | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | දීර්ඝ කාලීනව නඩත්තු කර නොමැත | |
| 2.2. 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසීම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණන අංශයක් නොමැත | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | භාණ්ඩාගරයට ඉදිරිපත් කිරීම | | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | හානි පාඩු නොවීම මත යාවත්කාලීන නොවේ | |
| 2.10 | බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | මූල්‍ය පාලන සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135) | අනුකූල වේ | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩ වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | වාර්ෂික සැලසුම් සකස් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම | අනුකූල වේ | අභ්‍යන්තර විගනණ අංශයක් නොමැත | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | විගණන විමසුම් | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | | |
| 6 | අභ්‍යන්තර විගණනය | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව විගණන සැලස්ම සකස් කිරීම | අනුකූල නොවේ | ආයතනයේ විගණන අංශයක් නොමැත. අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | - | අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | - | අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ | |

| | | | | |
|---|---|---|---|---|
| 7 | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ | |
| 8 | වත්කම් කළමනාකරණය | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ජේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ජේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | සැකසෙමින් පවතී | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | සැකසෙමින් පවතී | | |
| 9.2 | වාහන ගර්භිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | - | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | | | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1)ප්‍රකාරව,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නො ඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | වැඩ තහනම් වූ නිලධාරියකුගේ විනය පරීක්ෂණය පැවැත්වෙන බැවින් | මේ වනවිට විනය පරීක්ෂණය පැවැත් වේ |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුතු වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂනය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | අග්‍රිම නිකුත් කිරීම | | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල නොවේ | දෙපාර්තමේන්තුවේ **ආදායම් ගිණුමක් නොමැත.** | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නො කොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල නොවේ | දෙපාර්තමේන්තුවේ **ආදායම් ගිණුමක් නොමැත.** | |
| 15.3 | මු.රෙ.176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | දෙපාර්තමේන්තුවේ **ආදායම් ගිණුමක් නොමැත.** | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළු සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළු වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් | වෙබ් අඩවිය සැකසෙමින් | | |

| | | | | |
|---|---|---|---|---|
| | අඩවිය හරහා ලබා දී තිබෙන අතර,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | පවතී | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක/05 2008 හා 05/2018/(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | | |
| 18.2 | එම චක්‍රෙල්ඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චකුලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | මානව සම්පත් සැලැස්මක් සකස් කොට නොමැත | මානව සම්පත් සැලැස්මක් සකස් කරමින් පවතී |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ | අනුකූල නොවේ | මානව සම්පත් සැලැස්මක් සකස් කොට නොමැත | මානව සම්පත් සැලැස්මක් සකස් කරමින් පවතී |

| | | | | |
|---|---|---|---|---|
| | තහවුරු කොට තිබීම | | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | මානව සම්පත් සැලැස්මක් සකස් කොට නොමැත | මානව සම්පත් සැලැස්මක් සකස් කරමින් පවතී |
| **19.4** | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම | අනුකූල නොවේ | මානව සම්පත් සැලැස්මක් සකස් කොට නොමැත | මානව සම්පත් සැලැස්මක් සකස් කරමින් පවතී |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |